# තාරුණ්‍යය



මෙවර සන්නස කවරය සැරසෙන්නේ ආදරය මාතෘකා කරගත් සිතුවමකින්. ආදරය ගැන කියැවෙන, ලියැවෙන, සිතුවම් වන රංගනය වන හැම නිර්මාණයකදීම, අවස්ථාවකදීම ඊට යාවෙන්නකි යෞවනය. නැතිනම් තාරුණ්‍ය ය. අද සේයාව මවන කයාව සන්නස නම් කරන්නේ තාරුණ්‍යය නමින්.

බාල වියෙන් එළිපත්තට බැස නැවුම් ලොවක් සොයා යන ගමනේ පිය ගැට පෙළ මත වාඩි වී සිටින හිරිමල් යෞවනයෙකි මේ. තමන්ට නුහුරු සමාජයකට පිය මං කරන්නට ආරාධනා කෙරෙන අරුණැල්ලකින් කුල්මත් වූවා සේ ය හේ. සිව් නෙතක්ම දල්වාගෙන මේ කරනා විපරමට එක් වන්නේ තරුණයා පමණක්ම නොවේ. ඔහුගේ තනිකම මකනා නාඹර සුනබ සුරතලා ද ඊට වසඟව ඇති සෙයකි හැඟෙන්නේ. හිරිමල් වියට එක්වන බාලයකුගේ සිතෙහි ඇති වන කුහුල තනිකම අත් නොවින්දෙකු මේ දියතේ වේ ද? තනි කමට පිළියමකි සුරතලුන්. කුහුල දනවන දේ සඳහා පිළිතුරු සොයා යන්නට නිසි වයස යෞවනයාට එළඹී ඇත්තා සේ ය.




දෙමව්පිය සිතුම් රැහැණින් මිදී ඒ කවුළු දොරින් නික්ම යාමට කාලය එළැඹී ඇත්තා සේ ය. ඒ සඳහා ඔහු ජවසම්පන්න ය. නිවහල් සිතිවිලි වලින් අනූනය. වරදට කිපෙන රත් වූ රුහිරයෙන් උණුසුම් ය. චමත්කාර වූ ! ආනන්ද ජනක වූත් ආල හැඟුම් දෝර ගලා යන හදවතකින් ඒ රුහිරය රිද්ම ගැන්වෙන්නේ ය. සුහුඹුල් වියෙන් නික්ම පියඹා යාමට සැරසෙන කුරුවියෙකු සේ නොවේ ද හේ?

බැස යාමට ඇති පියගැට ගණනද සුළු පටු නොවේ. ආලෝකයක්ම විනා නුඹ කුසෙහි අනෙකක් නොදිසේ. තමා භාරගැනීමට සූදානම්ව ඇති සමාජය කෙබන්දක්ද? නිර්මල පිබිදුණු සිතුවිලි වලින් සපිරි තුරුණු සිත කුහකත්වය, ඊර්ෂ්‍යාව, වැනි කිළි කුණු වලින් තොර ය. ඒ නිසාම ඔවුන් සමාජය දකින්නේ ධණාත්මකව ප්‍රසන්න සිතිනි. එයමයි ඔහු දකිනා අරුණාලෝකය. එය යුගයෙන් යුගයට පායන අරුණැල්ලකි

ආදරයේ මල් ළඳුන්
කලංකයන් විහිදමින්
පෙමට කරන ඇරයුමින්
බැඳෙයි මලවි සමනලුන්

**මෙවර සන්නස කවරයේ සිත්තම**
**සිසිර දිසානායක**

විශ්ව සාහිත්‍යයේ තාරුණ්‍යය පිළිබඳව ලියැවුණ දෑ අනන්තයි. විශාරද ගුණදාස කපුගේ ශිල්පියාණන් ඒ අතරින් තෝරා බේරා හුවා දක්වූ අපූරු කාව්‍යයක සංක්ෂිප්ත පරිවර්තිත පද පෙළක් මෙලෙස ලියැවෙන්නේ වසර කීපයකට පෙරාතුව අප අතරින් වියෝ වූ එතුමන්ට කෘතඥතාව, උපහාරය දක්වීමට ද ඉඩක් ලබා ගනිමිනි. ජපන් කවි Daisaku Ikeda ගේ Songs From My Heart නම් වූ මහා කාව්‍ය ග්‍රන්ථයේ එන Songs of Youth දීර්ඝ කාව්‍යයේ හරස් කඩක් වූ මෙම පද පෙළ කපුගේ ශිල්පියාගේ ගීයක් ලෙසින් එළි දක්වන්නට වරම් ලබා තිබුණ ද එතුමාගේ අකල් වියෝව ඊට හරස් විය. තාරුණ්‍යය පිළිබඳ නොලියවුණ මානයකට අප කැඳවා ගිය කාව්‍යයකි ඒ.

තාරුණ්‍යයේ - ළා හිරුයි
මේ නැගී එන්නේ
සුළං හැමුවාවේ - වළා නැඟුනාවේ

උකුසු දෑසින් වරද දකිනා
කුපිත සිත් පෙළ කළහ කරනා
සීහ සෙයියාවෙන්
සදාකාලික සත්‍යයේ නුවර නැංවේ
නැවුම් ගිනියම් රුහිරයෙන්

පියාපත් බැඳි අනුන් මුදනා
සිතැඟියාවන් මාන බලනා
ප්‍රේම උන්මාදෙන්
මවා පානා නිදහසේ පවුරු සිඳලේ
යටගියාවේ නාමයෙන්

පරිවර්තනය හා සටහන
සිසිර දිසානායක
ජායා බුද්ධිනී ඒකනායක




**මිනිහෙක් වූ ගෝලයා**

ගුරුතුමා ඉදිරියේ වාහනයක් නැවතුණා.. වාහනයෙන් බැහැලා ආවෙ හොඳ සූට් එකක් ඇඳගත්ත තරුණ මහත්තයෙක්.. තරුණයා ගුරුතුමාට දණගසා වැන්දා..

"සර්ට මාව මතකද..? දවසක් ඉස්කෝලෙදි මගේ වරදකට සර් මට ගැහුවා.. උඹ මිනිහෙක් වෙනවද නැත්නම් බල්ලෙක් වෙනවද කියලා එදා සර් මගෙන් ඇහුවා.. ඒක මගේ හිතට හරියට වැදුණා.. මං ඉතින් සර් නිසා මිනිහෙක් වුණා.." තරුණයා කිව්වා.

ගුරුතුමා ඇස් වල කඳුළු පුරෝගෙන බලා හිටියා. මේ කතාව මට කිව්වෙ ඒ ගුරුතුමා වෙච්ච වි ක ධර්මබන්දු මහත්තයමයි.

**සංස්කෘතික වසන්තය සහ ස්කැට්ස්**

මෙල්බන් ශ්‍රී ලාංකික සමාජයට සංස්කෘතික වසන්තයක් උදා වෙලා වගෙයි. බොහෝ සංස්කෘතික ක්‍රියාකාරකම් හැම සති අන්තයකම මේ පුරයේ තැන තැන පැවැත්වෙනවා. ඒක සතුටක්.

බොහෝ සමිති සමාගම් අනුග්‍රහයෙන් කෙරෙන මේ කටයුතු අතරේ ඔස්ට්‍රේලියාවේ පදිංචි ලාංකිකයන්ගේ දක්ෂතා ඔප් නංවන්න මහන්සි වෙන සමිතියක් ගැන සටහනක් නොතියාම බැහැ. කාලයක සිට බොහොම නිහඬ ලෙස මේ කටයුත්ත කරන ස්කැට්ස් සංවිධානයටත් එහි සංස්කෘතික අංශයටත් විශේෂයෙන් ඒ පිටුපස සිටින අපේ හිතවත් මාලිනී ජයසිංහ මහත්මියටත් මල් මිටක් පුදන්න අපි කැමතියි. ඒ තව තවත් මෙවැනි කටයුතු කරන්නට ධෛර්යයක් වන ලෙසයි.

**පුංචි මිනිහකුගෙ ලොකු හදවතක්**

රෝහණ ධර්මකීර්ති නම් වන සුන්දර මිනිසා ආපහු ලංකාවට ගියේ හැමදාව වගේ හිතේ කඳුලක් ඉතිරි කරමින්. ඔහු ඔස්ට්‍රේලියාවට පැමිණ මට දුරකථනයෙන් කතා කළ පළමු විනාඩියේ ම මා විශ්මයට පත් කළේ කතා බහ තීරයේ මා වරින් වර ලියූ සටහන් කීපයක් මතකයෙන් කියමින්.

"පුදුම වෙන්න එපා මං ඒවා කියවනවා විතරක් නෙවෙයි.. ඒවාගේ සැඟවිලා තියෙන මානුෂික පැත්ත හොඳට තේරුම් ගන්නවා.." ඔහු මගේ සටහන් කීපයක සැඟවුණ පැත්ත ගැන බොහෝ දේ කතා කලා. " ...හුඟක් මිනිස්සුන්ට නොතේරෙන ඒ දේ මට තේරෙනවා.. මං ඒවා ලංකාවේ මගේ යාළුවන්ට පවා පෙන්නනවා.. මෙන්න බලාපල්ලා මේ මිනිස්සු ඔස්ට්‍රේලියාවට වෙලා කොයි තරම් දේ කතා කරනවද..? මේ ලංකාවෙ ඉන්න ඕනෙ මිනිස්සු නේද..? කියලා මම යාළුවන්ට කියනවා... ඔයා ලියන දේ අගය කරන පුංචි මිනිහෙක් ලංකාවෙ ඉන්න බව අමතක කරන්න එපා..." රෝහණ කිව්වා.

මං දැන් අවුරුදු හතරක් විතර තිස්සෙ ඉඳන් කතා බහ ලියනවා. කතා බහ ජනප්‍රිය බවත් මම දන්නවා. ඒත් මේ වගේ හිතට සතුටක් ගෙනෙන සඳහනක් අහන්න ලැබෙන්නෙ බොහොම කලාතුරකින්. රෝහණට පත්තර යවන සුදුහාමිනේටත් ස්තුතියි.




***දේශීය මලල ක්‍රීඩාව හාන්සි***

ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩාවෙන් පදක්කම් දිනා ගැනීම තව වසර දහයකින් මෙපිට ඉටුනොවන සිහිනයක් වෙතැයි විචාරකයෝ පවසති. එයට ප්‍රධාන හේතුව ලෙස විශිෂ්ඨ කුසලතා සහිත ක්‍රීඩකයන් බිහිනොවීම සහ වත්මන් ක්‍රීඩකයන් රැක ගැනීමට නිසි ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවී ඇත. මෙයට පෙර යුගයේ සිටි සුසන්තිකා, සුගත්, ශ්‍රියානි සහ දර්ශා වැනි විශිෂ්ඨ ක්‍රීඩකයන් වෙනුවෙන් නව ආදේශ ක්‍රීඩකයන් තවම බිහිව නොමැති අතර ඔවුන් තැබූ වාර්තා තවමත් නොබිඳී පැවැතීම මෙවැනි නිගමනයකට එළඹීමට ඉඩ ප්‍රස්තා සපයා දී ඇතැයි විචාරකයෝ පෙන්වා දෙති.

***අනුරාධ ඉන්ද්‍රජිත් අනුන්ගේ රේස් එකක් දුවලා***

ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පසුගියදා පින්ලන්තයේ හෙල්සින්කි නුවර බලා ගිය මලල ක්‍රීඩා කණ්ඩායමේ මැරතන් ධාවක අනුරාධ ඉන්ද්‍රජිත් කුරේ හට තම තරගය සම්පූර්ණ කිරීමට අවස්ථාවක් උදාවුණේ නැතැයි වාර්තා විය. එම තරගයේ හරි අඩක් අවසන් කරද්දී ලෝකයේ විශිෂ්ඨම මැරතන් ධාවකයන් සමග ධාවනය යෙදී සිටි ඔහු කිලෝමීටර් 20 ක් ධාවනය කොට තරගය අතහැර දමා තිබේ. එම දුර ප්‍රමානය පැය 1 විනාඩියක් තුළදී නිම කිරීම ඉතා විශිෂ්ඨ ක්‍රියාවක් වුවද තරගය අවසන් කිරීමට තරම් ප්‍රමාණවත් ශක්තියක් ශ්‍රී ලංකා ක්‍රීඩකයා සතුව නොතිබුණේ යැයි වාර්තා වේ. එයට හේතුවී ඇත්තේ අනුරාධ ඉන්ද්‍රජිත් කුරේ තම ධාවන රිද්මය පසෙකලා ලෝකයේ සුපිරි ධාවකයන්ගේ රිද්මයට ධාවනයේ යෙදීමයි. ඔහු මෙවැනි තත්ත්වයකට පත්ව ඇත්තේ දේශීය පුහුණුකරුවකුගේ අනුවන උපක්‍රමයක් ක්‍රියාවට නැංවීමට යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් යැයි පැවසේ.

**චමින්ද සමන් කුමාර**




ජනතාවගෙන් උදුරන්න හැදූ ඡන්ද බලය ආරක්ෂාවුණා මීළඟට අවශ්‍ය සාධාරණ ජනපතිවරණයක් විපක්ෂ නායක රනිල් කියයි
**ලංකාදීප**
*හැමෝම කළේ ජනතාවගේ අයිතිය උදුරා ගත්ත එකම තමයි මහත්තයා.*

--------------------

රාත්‍රී එකෙන් පසු සමාජ ශාලාවල මත්පැන් තහනම් **ලංකාදීප**
*නියමයි.. දැන් ඉතින් මීට පස්සෙ සියලුම මැර ක්‍රියා නවතිනවා සිකුරුයි.. කොහොමද අපේ පොලීසියෙ මොළේ..? නියමයි නේද..?*

--------------------

පිරිත් මන්ඩපයට කඩා වැදුණු දෙදෙනෙක් කරඬුව පැහැරගෙන යති. **ලක්බිම**
*යකඩ දාච්ච ගෙයි පුළුන් ඉතිරි වේවිද යාළුවා...*

--------------------

නිළධාරීන් පුටුවල - වී අස්වැන්න අටු වල
**දිවයින**
*ගොවීන්...????*

--------------------

කාන්තාවන් තම වටිනාකම වටහාගෙන ඉදිරියට පැමිණිය යුතු කාලය එළැඹිලා. බීජිං නුවර ලෝක කාන්තා සමුළුවේදී ජනපතිනිය කියයි. **ලංකාදීප**
*එක් කාන්තාවක් ඉදිරියට ඇවිත් කල හරිය මතක් වෙනකොට ඔක්කොම කාන්තාවො ඉදිරියට ආවොත් මොනා වේවිද කියලා අපට නම් බයත් හිතෙනවා.*

--------------------

මගම යළි පිහිටුවන පනත සම්මතයි වැඩි ඡන්ද 115 යි **ලංකාදීප**
*ඉඳලා හිටලා මොළේ ඇති වැඩත් කරනවා...*

